*කියවන්න....*

මේ වන විට ශීඝ්‍රයෙන් පැතිර යන කොරෝනා හෙවත් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් විශ්වවිද්‍යාල පවුල් වෛද්‍ය මධ්‍යස්ථානයේ අපට සුපුරුදු පරිදි සේවාවන් සැපයීමට නොහැකි වීම පිළිබඳ බලවත් කනගාටුව පළ කරමු.

තව ද  ආරක්ෂිත උපකරණ සහ රසායනික ද්‍රව්‍ය ලබා ගැනීමට ඇති ප්‍රමාදය නිසා මෙම තීරණාත්මක අවස්ථාවේ දී සායනික කටයුතු සුපුරුදු පරිදි පවත්වාගෙන යාමට අපහසු වී ඇත.

එසේ ම රෝගීන් එක් තැනකට රැස් කිරීම මගින් අසාදිත රෝගීන්හට නිරාවරණය වීමේ අවදානමක් පවතින හෙයින් දුරකථන සංවාද ඔස්සේ සෞඛ්‍ය උපදෙස් ලබා දීමටත් බෙහෙත් වට්ටෝරු WatsApp, කෙටි පණිවුඩ (SMS) හා විද්‍යුත් පණිවුඩ (Email) මගින් හැකිතාක් දුරට ලබාදීමටත් කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමු.

මෙම වසංගත අවස්ථාවේ දී ඔබ වෙනුවෙන් කළ හැකි හොඳ ම සහ ආරක්ෂිත ම සේවාව ලබා දීම අප සායනික වෛද්‍යවරුන්ගේ අරමුණයි.

දියවැඩියාව, අධික රුධිර පීඩනය, හෘද රෝග වැනි නිදන්ගත රෝග ඇති අයට මෙම වසංගත රෝගය වැළඳුණහොත් සංකූලතා ඇතිවීමේ අවදානම වැඩි ය. එම නිසා මේ අවස්ථාවේ ඔබ විසින් කළ යුත්තේ එම රෝග තත්ත්ව සඳහා අඛණ්ඩ ව ඖෂධ ලබා ගැනීමයි.

ඔබට යම් හෙයකින් මේ සඳහා බෙහෙත් වට්ටෝරු ලබා ගැනීමට අවශ්‍ය නම්, අපි හැකිතාක් දුරට ඒ සඳහා ඔබට සහාය වීමට උත්සාහ දරන්නෙමු. මීට අමතර ව ඔබට වෙනත් රෝග තත්ත්ව සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීමට අවශ්‍ය නම්, ඒ සඳහා ද අපි කටයුතු සලසන්නෙමු. ඔබ පමණක් නොව, ඔබේ පවුලේ ඕනෑ ම සාමාජිකයකුගේ රෝගී තත්ත්වයන් සඳහා  මෙම සේවාව විවෘත බව ද දන්වනු කැමැත්තෙමු.